සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය — පැය 02 යි
கண்டுபிடிப்பு சோதனை — 02 மணி நேரம்
Diagnostic Test — 02 Hours

සිංහල භාෂාව හා සාහිත්‍යය 11 — 11ශ්‍රේණිය
சிங்கள மொழி மற்றும் இலக்கியம் — தரம் 11
Sinhala Language and Literature — Grade 11

**සැලකිය යුතුයි.**

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

01. (i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න.කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අදින්න .

i. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය.එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

”කසල කළමනාකරණය පිළිබඳ පවතින ගැටලු නිරාකරනය කිරීම කාලීන අවශයතාවක් බව පරිසරවේදීහු පෙන්වා දෙති.”

ii. පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් තද්ධිත පදයක් හා නිපාත පදයක් උපුටා දක්වන්න.
ප්‍රේක්ෂකයන් විසින් ක්‍රීඩකයෝ ඔල්වරසන් දී දිරිමත් කෙරෙනු ලැබුහ.

iii. අ. වර්ගාන්ත අනුනාසික්‍ය අක්ෂර දෙකක් ( 02 ) ලියන්න.

ආ. දන්ත ඕෂ්ඨජ අක්ෂර දෙක නම් කරන්න.

iv. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

අ). ප්‍රදාන ආ). ප්‍රධාන

v. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.

අ. වැහි පොද මගේ හිමිගේ හිස මත **නොවැටේවා !**

ආ. ගායිකාවක ගීත **ගයද්දී** රසිකයෝ අත්පුඩි ගැසූහ.

vi. පහත සඳහන් පද සන්ධි කොට ලියා , සන්ධි වර්ගය නම් කරන්න.

අ. ලෝක + උපකාරය

ආ. කුරුලු + ආ

vii. පහත සඳහන් වාක්‍ය සදොස්ය.ඒවා නිදොස් කර නැවත ලියන්න.

අ. මිනිස්සු පැමිණියහොත් අපි රැස්වීම පවත්වමු.

ආ. විදුහල්පතිතුමා හෝ මා හෝ රැස්වීමට යමු.

viii. පහත දැක්වෙන පද වලට සමානාර්ථ පදය බැගින් ලියන්න.

අ. කුරුල්ලා

ආ. ඇස

ix. පහත සඳහන් යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත.වඩාත් ගැලපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය සකස් කර ලියන්න.

අ. ත්‍රිපිටක දහම

ආ. පළමු ත්‍යාගය

x. පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.

අ. දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන

ආ. සමාන හදවත් ඇත්තා (ලකුණු 2 x 10 =20)

02. පහත දැක්වෙන (අ) (ආ) ඉ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න.රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

අ. ජංගම දුරකථනය මුළු ලෝකය ම සියතට ගත හැකි විස්මය ජනක උපකරණයකි.වර්තමානය වන විට එය බහු කාර්ය උපකරණයක් බවට පත් වී ඇත. මිනිසාගේ යහපතට මෙන්ම අයහපතට ද එය භාවිත කළ හැක. තරුණ පරම්පරාවේ අධ්‍යාපන සංවර්ධනයට මෙන්ම සමාජ ජාලා වෙබ් අඩවි භාවිතයෙහි ඇබ්බැහි වීමට ද දුරකථනය හේතු පාදක වේ.සමස්ත ප්‍රජාව මේ පිළිබඳ අවධානය යොමු කළ යුතු කාලය එළැඹ ඇත.

ආ. ලෝකයේ විවිධ කාල පරිච්ඡේදයන්හි දී විවිධ ආකාරයේ මනුෂ්‍ය ප්‍රජාවගේත් සත්ත්ව ප්‍රජාවගේත් දෛනික ජීවිතයට බාධා පමුණුවන සෞඛ්‍යාරක්ෂිත ගැටලු පැන නැගී ඇත. කොවිඩ් -19 වසංගතය එවැනි සෞඛ්‍යමය ගැටලුවකි.මෙම කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සමාජ , ආර්ථික , ආගමික , සංස්කෘතික ජීවිත සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට නොහැකි වී ඇති අතර සංවර්ධන කාර්යයන් අඩපණ වී ඇත.ඉදිරි අනාගතය පිළිබඳව ද නිශ්චිත තත්ත්වයක් නොමැති බැවින් විධිමත් සැලැස්මක් යටතේ නව කොවිඩ් සාමාන්‍යකරණයකට ලක්ව ක්‍රියාකිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇත.

ඉ. පාසල , සාරධර්මයේ තෝතැන්නක් බවට පත්විය යුතු වුවද මේ වන විට එමගින් සාරධර්ම වියැකී යාමේ කනගාටුදායක තත්ත්වයක් උදා වී තිබේ. මීට බලපාන හේතු රාශියකි.එකී පසුබිම අවම කරගනිමින් පාසල , සාරධර්මයෙන් සුපෝෂණය කර ගැනීමේ ක්‍රියාවලියට රටවැසි සැවොම දායක විය යුතු වන්නේය.

(ලකුණු 25)

03. පහත දැක්වෙන පාඨය වචන 65-75 අතර වන සේ සාරාංශ කොට ලියන්න.

සාහිත්‍යකරුවා තමාගේ අත්දැකීම් පාඨකයාට ඉදිරිපත් කරන්නේ භාෂාව මගිනි. භාෂාව වු කලි අදහස් හා හැඟීම් ගෙන යන වාහකයයි. ලේඛකයා තම හදවත කම්පනය කළ අත්දැකීමක් ප්‍රතිනිර්මාණය කරන්නේ වචන අනුසාරයෙනි. සාහිත්‍ය වනාහි භාෂාත්මක වික්‍රමයකි. සාහිත්‍යය භාෂාත්මක වික්‍රමයක් හෙයින් ප්‍රතිභාසම්පන්න ලේඛකයෙකු සතු ගුණාංගයක් විය යුත්තේ භාෂාධිපත්‍යයයි. තමාට අභිමත පරිදි බස හසුරුවා ගැනීමේ ශක්තියක් ඔහුට තිබිය යුතුය. ඒ හෙයින් ලේඛකයෙකුගේ නිපුණතාව බොහෝ දුරට ප්‍රකට වන්නේ ඔහු භාෂාව ස්වකීය කාර්යය සාධනය සඳහා වහල් කොය ගන්නා ආකාරයෙන් බව කිවමනා ය.

සාහිත්‍යකරුවා උපයෝගී කොට ගන්නා භාෂා මාධ්‍යයෙහි කිසියම් විශේෂතාවක් ඇත. එම විශේෂත්වය ප්‍රත්‍යක්ෂ කොට ගත හැක්කේ සාහිත්‍යකරුවන්ට අන්‍යතර වුවන් භාෂාව පරිහරණය කරන ආකාරය පරීක්ෂා කිරීමෙනි. සාහිත්‍යයික භාෂාවේ විශේෂත්වය වු කලි එහි ඇති භාවික ගුණයයි. පාඨකයාගේ භාවයන් ප්‍රබෝධ කොට ඔහු අත්දැකීමකට සහභාගි කරවා ගැනීමේ ශක්තියයි. ප්‍රතිභාසම්පන්න ලේඛකයෙකු අපූර්වත්වයෙන් යුක්ත භාෂාවක් නිර්මාණය කිරීමට අමුතුවෙන් වෙහෙස වන්නේ නැත. එහෙත් සමහරු ඉතා කෘත්‍රිම ආකාරයට එම අපූර්වතාව ඇති කිරීමට වෑයම් කරති. පද්‍යයට ම විශේෂි වු වචන මාලාවක් ඇතැයි සමහරු කල්පනා කරති.ඒ නිසාම බැලූ බැල්මට සුන්දර යයි පෙනෙන වචන ඔවුහු පද්‍යකරණය සඳහා යොදා ගනිති. එහෙත් එබඳු සුන්දර වචන යෙදීමෙන් ම කාව්‍ය භාෂාවේ භාවපූර්ණත්වයක් ඇති නොවේ. කාව්‍ය භාෂාව අත්දැකීම සමග අත්‍යන්තයෙන් ම බැඳී පවතින්නක් විය යුතුය.නිර්මාණාත්මක සාහිත්‍ය කෘතියක් එක් භාෂාවකින් තවත් භාෂාවකට පරිවර්තනය කිරීම දුෂ්කර වන්නේ ඒ හෙයිනි.

(ලකුණු 10)

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

එඩ්වඩ්ගේ කුලුන පිළිබඳ ඇසූ කියවන්නෝ සිටිත් නම් ඒ ඉතා අල්ප විය හැකිය. මෙය රුමස්සල කන්ද මුදුනේ පිහිටා ඇත. කාලයාගේ ඇවෑමෙන් කළුවන් බවට පත් වු මෙය සිමෙන්තියෙන් සාදන ලද අඩි 60 ක් පමණ උස කුළුනෙකි. බොහෝ කලකට පෙර මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවය කළ

එඩ්වර්ඩ් නම් මහතෙකු විසින් මෙය ඉදි කරනු ලැබුයේ ත්‍රිකෝණමිතික ස්ථානයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනිමට ය. මේ ලේඛකයා හිණි මං කිහිපයක් තබා එය මතට 1921 වසරේ දී නැග්ගේය. ඒ යම් කිසි නිරීක්ෂනයක් කිරීම සඳහාය. ඒ මත සිට බැලු විට ගැල් වරාය , ගැල් නගරය සහ අවට ප්‍රදේශය , සමනොළ කන්ද දක්වා එහි සිට නැරඹිය හැකි විය.

රුමස්සල පැරණි ඉතිහාසයක් ඇති කඳු ගැටයෙකි. ඒ බතිහාසය කාලයාගේ මිහිඳුම් පටලය තුළින් රාමා සීතා වෘතාන්තය දක්වා දිව යයි. ලක්ෂමනට තුවාල ලැබු විට ඔහුට ඖෂධ සෙවීමට සිදු විය. හනුමන් ඒ ඔසු සෙවීම සඳහා හිමාලයට යැවිණ. එහි යද්දී හනුමන්ට ඒ පැළෑටියේ නමත් හැඩයත් අමතක විය. ඒ නිසා ඔහු හිමාලය කන්දෙන් කොටසක් කඩාගෙන තම වල්ගයේ ඔතාගෙන පැමිණියේය. එය ගාල්ල අසලදී බිමට වැටුණි. එවිට ඔහු රාමා වෙත ගොස් ඔහුටම එම ඖෂධය සොයා ගන්නා ලෙස ඉල්ලා සිටියේය. අද දක්වා ම රුමස්සල , හිමාලය නම් පුජනීය කන්දෙන් කොටසක් බව තරයේ අදහනු ලබයි. සත්‍යාසීහු එහි ගොස් ‘සන්සේවි’ නැතහොත් සදාකාලිකත්වය ගෙන දෙන පැළෑටියක් සෙවීමට වෙහෙසත් , ලංකාවේ ජනප්‍රවාදයේ ද මේ මතය පවතින අතර , මෙහි පමණක් ඉතා වටිනා දුර්ලභ ඖෂධ පැළෑටි ඇති බවට විශ්වාසයක් ඇත.

i. මෙම ඡේදයෙන් විස්තර කෙරෙනුයේ කුමන ස්ථානයක් පිළිබඳවද ?
ii. මෙහි සඳහන් පරිදි මෙම කඳු මුදුනෙහි පිහිටුවා ඇති කුලුන ඉදි කරනු ලැබුයේ කවරෙකු විසින්ද ?
iii. එඩ්වඩ් ගේ කුලුණට නැගුණු විට නැරඹිය හැකි ස්ථාන මොනවාද?
iv. කතුවරයා සඳහන් කරන ආකාරයට ‘සත්‍යාසීහු’ සහ වෙනත් ජනයා කඳු ප්‍රදේශයට යන්නේ කුමන ඖෂධ පැළෑටිය සෙවීම සඳහාද?
v. ඡේදයේ සඳහන් වන ආකාරයට මෙම ප්‍රදේශය නිර්මාණය වීම හා සම්බන්ධ පුරාවෘත්තය සහ නිර්මාණය වීම හා සම්බන්ධ පුරාවෘත්තය සහ සත්ත්වයා කවුරුන්ද ?

05. පහත දැක්වෙන විස්තරය පදනම් කරගෙන <u>අයදුම්පත්‍රයක්</u> සකස් කරන්න.

රත්නපුර ප්‍රදේශයේ ප්‍රසිද්ධ පර්යේෂණ ආයතනයක් වන ‘රිසර්ච් ජේපර් ’ ආයතනයේ පර්යේෂණ නිලධාරි තනතුරු සඳහා පුරප්පාඩු පවතී. මෙම තොරතුරු සඳහා වයස අවු. 20 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.උසස් පෙළ සමත් වීම අනිවාර්ය වේ. විෂය බාහිර ක්‍රියාකාරකම් , පළපුරුද්ද හා නායකත්වය වැනි ගුණාංග කෙරෙහිද අවධානය යොමු කෙරේ. මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට ඔබේ තොරතුරු දන්වා සුදුසු අයදුම්පත්‍රයක් සකස් කරන්න.

හෝ

පහත දැක්වෙන විස්තරය පදනම් කරගෙන රාජකාරි ලිපියක් ලියන්න.

ඔබ විදුහලේ වාර්ෂික කලා උළෙල දිනට ඉදිරිපත් කෙරෙන වැඩ සටහන පිළිබඳ න්‍යාය පත්‍රයක් සකස් කරන්න.මෙහි සංවිධායක ඔබ යැයි සිතා කාල කළමණාකරණය පිළිබද සැලකිලිමත් වෙමින් උළෙලේ සෑම අංගයක්ම ඇතුළත් කරන්න.

පිළිතුරු පත්‍රය - 11 කොටස

01.

i. කසළ
නිරාකරණය

ii. තද්ධිත පදය - දිරිමත් ( මත් ප්‍රත්‍යය )
නිපාත පදය - විසින්

iii. අ , ඕ , ඤ , ණ , න , ම
ආ , ව , ෆ

iv. අ , ප්‍රදාන - කෙනෙකු වෙත ලබා දෙන , පිළිගන්වන යන අර්ථයෙහි වාක්‍යයක්
උදා - තෑගි ප්‍රදානය සඳහා උත්සවයක් සංවිධානය කරයි.

ප්‍රධාන - මූලික / ප්‍රමුඛ යන අර්ථයෙහි
උදා - ප්‍රධාන අමුත්තා උත්සව ශාලාවට පැමිණියේය.

v. අ. ආශිර්වාද ක්‍රියා
ආ. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

vi. අ. ලෝක + උපකාරය - ස්වරාදේශ
ලෝක් + අ + උපකාරය - සන්ධිය
ඕ
ලෝක් + ඕ + උපකාරය
කෝ
ලෝකෝපකාරය

ආ. කුරුලු + ආ - ද්විත්වරූප සන්ධිය
කුරුල් + ~~උ~~ + ආ
කුරුල් + ල් + ආ
කුරුල්ලා

vii. අ. <u>මිනිසුන්</u> පැමිණියහොත් අපි රැස්වීම පවත්වමු.
ආ. විදුහල්පතිතුමා හෝ <u>මම</u> හෝ රැස්වීමට යමි.

viii. අ. සකුණ , සියොත් , විහඟ
ආ. නයන , අක්ෂි , ලෝචන

ix. අ. ත්‍රිපිටක ධර්මය / තෙවලා දහම
ආ. ප්‍රථම ත්‍යාගය / පළමු තෑග්ග

x. අ. චිරාගත
ආ. සහෘදයා

(ලකුණු 2 x 10 =20)

02. සුදුසු පරිදි පිළිතුර ගොඩනගා තිබිය යුතුයි. (ලකුණු 25)

03. පහත ප්‍රධාන අදහස් සාරාංශයෙහි තිබිය යුතුයි.

- අදහස් හා හැඟීම් වාහකයක් කොට ලේඛකයා තම අදහස් පාඨකයාට සමීප කරන්නේ භාෂාවෙනි.
- සාහිත්‍ය , භාෂාත්මක වික්‍රමයකි.
- භාෂාව ආධිපත්‍යයට ගෙන අපේක්ෂිත අරමුණ කරා වචන අනුසාරයෙන් බස යෙදීම ලේඛකයා සතු ගුණාංගයකි.
- භාවික ගුණය භාෂාවේ විශේෂත්වයකි.
- පාඨකයාගේ භාවයන් ප්‍රබෝධ කොට ඔහු රචනය තුළ රඳවා ගැනීම ලේඛකයා සතු හැකියාවකි.
- කාව්‍යමය හා සුන්දර වචන මගින් භාෂාව අත්දැකීම සමග බද්ධ විය යුතුය.
- උසස් කෘතියක් පරිවර්තනය කිරීම අසීරුය.

(ලකුණු 25)

04.

i. රූමස්සල නක්ද පිළිබඳ
ii. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවය කළ එඩ්වඩ් නම් සමත්මයෙකු විසින්
iii. ගාලු වරාය , ගාලු නගරය හා අවට ප්‍රදේශය , සමනොළ කන්ද / ශ්‍රී පාදය
iv. 'සන්සේවි' නොහොත් සදාකාලිකත්වය ගෙන දෙන පාළුටියක් සොයා
v. රාමා සීතා පුරාවෘත්තය
හනුමාන් නම් සත්ත්වයා

(ලකුණු 2 x 5=10)